සැ. යු. - 2017.05.19 වැනි දින පළ වූ අංක 2020 දරන ගැසට් පත්‍රයේ I V (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,021 - 2017 මැයි මස 26 වැනි සිකුරාදා - 2017.05.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 886 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.*- (i) අබ්දුල් මජීද් ඇකඩමි (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 මැයි මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත 2017 මැයි මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) විජය උදාන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 මැයි මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 ජූනි මස 16 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 ජූනි මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

855- B 81174 — 5,403 (2017/05)
F 1 -

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීම - 2017

**(සිංහල/දෙමළ /ඉංග්‍රීසි මාධ්‍ය)**

වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ පුරප්පාඩු සඳහා වයඹ පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට දිස්ත්‍රික් පදනම මත බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි උපාධිධාරීන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

01. දිස්ත්‍රික් පදනම මත බඳවා ගැනීම සිදු කරන අතර, එම බඳවා ගැනීමේදී අදාල දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය ලබා දෙන හෙයින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාසල්වල පවතින විෂය පුරප්පාඩු සඳහා ද, පුත්තලම දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් පුත්තලම දිස්ත්‍රික්කයේ පාසල්වල පවතින විෂය පුරප්පාඩු සඳහා ද ඉල්ලුම් කල යුතුය. එක් දිස්ත්‍රික්කයක විෂය පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමාණවත් සුදුස්සන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක අනෙක් දිස්ත්‍රික්කයේ එම විෂය සඳහා සුදුසුකම් ලැබූවන්ගෙන් පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

02. පුරප්පාඩු සංඛ්‍යාව 1000 කි. එක් එක් දිස්ත්‍රික්කයට අදාල විෂය පුරප්පාඩු උපලේඛන 01 හි දැක්වේ. එසේ වුව ද පවතින ප්‍රතිපාදන හා සේවා අවශ්‍යතාවය මත බඳවා ගන්නා සංඛ්‍යාව සංශෝධනය විය හැක.

03. *වැටුප් ක්‍රමය :* -

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I හි GE 1 - 2016 වැටුප් පරිමාණය රු.27,740 - 6 x 300 - 7 x 380 - 2 x 445 -රු.33,090 මෙම තනතුරට අදාල වේ. නමුත් 2020.01.01 දක්වා වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

04. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

4.1. අධ්‍යාපන සුදුසුකම් :

(i) ගුරු පත්වීම්වලට අදාලව පිළිගත් සුවිශේෂී කරනලද විෂය ක්ෂේත්‍රවලට අයත්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් හෝ ප්‍රදානය කරනු ලැබූ උපලේඛන අංක 01 හි සඳහන් කර ඇති විෂයයන් ට අදාල උපාධියක් ලබා තිබිය යුතුය. මෙම උපාධිය අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර වලංගු උපාධියක් විය යුතු යි ;

*සහ*

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව සහ ගණිතය යන විෂයයන් සමත් වී තිබිය යුතු යි.

**ඉතා වැදගත් :**

- ස්වකීය උපාධිය අනුව ඉල්ලුම් කළ හැකි විෂයයන් පිළිබඳව අයදුම්කරුවන් සැලකිලිමත් විය යුතු ය.
- උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් අනුව පමණක් අදාල ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කල යුතු ය.
- ඉල්ලුම් කල හැකි උපරිම විෂයයන් සංඛ්‍යාව 3 කි.
- ඉල්ලුම් කළ විෂයය/විෂයයන් කිසිදු ලෙසකින් පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

4.2 කායික සහ මානසික යෝග්‍යතාවය :

සෑම අපේක්ෂකයෙකුම ගුරුවරයෙකු වශයෙන් රාජකාරි ඉටු කිරීමට සරිලන මානසික සහ ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

4.3 වයස ඃ

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස් සීමාව අවුරුදු 21 වේ. උපරිම වයස් සීමාව අවුරුදු 42 වේ.

4.4 වෙනත් සුදුසුකම් ඃ

i. අයදුම්කරු /අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු යි.

ii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු යි.

iii. වයඹ පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතු ය.

iv. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් වයඹ පළාත් සහා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් විය යුතු ය. (ඡන්ද හිමි නාම ලේඛනය මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතු ය.)

05. *සේවා කොන්දේසි* ඃ

I. රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය සේවා පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලට ද, වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසි වලටද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධන වලටද, යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

II. මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට පත්වීම් ලාභීන් යටත් විය යුතු ය.

III. මෙම තනතුරට පත් කරනු ලබන්නන් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

IV. වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුව උසස්වීම් සිදු කරනු ලැබේ.

V. 2014.01.21 දිනැති රා.ප.ච.01/2014 හා එයට වරින් වර සිදු කරන සංශෝධනයන්ට අනුව සේවයට පත්වී වසර 05 ක් ඇතුලත තනතුරට නියම කර ඇති දෙවෙනි රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු යි.

VI. මුල් පත්වීම ලබන දිස්ත්‍රික්කයේ අවම සේවා කාලය වසර 10 ක් ද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අවම සේවා කාලය වසර 06 ක් ද, සේවා අවශ්‍යතාවයට යටත්ව මුල් පත්වීම ලබන පාසලේ අවම සේවා කාලය වසර 05 ක් ද සේවයේ යෙදිය යුතු වේ. එසේම තම මුල් පත්වීම ලබන පාසල අතිදුෂ්කර/දුෂ්කර පාසලක් නොවන කල්හි තම සේවා කාලය තුල ඕනෑම අවස්ථාවකදී අවම වශයෙන් වසර 05 ක කාලයක් අතිදුෂ්කර /දුෂ්කර පාසලක සේවය කිරීමට ද බැඳී සිටී.

06. 6.1 *බඳවා ගැනීමේ ක්‍රමය ඃ*

I. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් එම දිස්ත්‍රික්කයේ පාසල්වල පවතින විෂයයන්හි පුරප්පාඩු සඳහා ද, පුත්තලම දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් එම දිස්ත්‍රික්කයේ පාසල්වල පවතින විෂයයන්හි පුරප්පාඩු සඳහා ද දිස්ත්‍රික් පදනම මත බඳවා ගනු ලැබේ.

II. එක් එක් දිස්ත්‍රික්කයේ විෂයය/ විෂයයන් සඳහා ඉල්ලුම් කළ අයදුම්කරුවන් සංඛ්‍යාව, පුරප්පාඩු සංඛ්‍යාවට සමාන හෝ අඩුවන අවස්ථාවකදී තෝරා ගැනීම සඳහා ලිඛිත තරඟ විභාගයක් හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් නොපැවැත්වෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පමණක් පවත්වා බඳවා ගනු ලැබේ.

III. එක් එක් දිස්ත්‍රික්කයේ විෂයය/විෂයයන් සඳහා ඉල්ලුම් කළ අයදුම්කරුවන් සංඛ්‍යාව, පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩිවන අවස්ථාවකදී තෝරා ගැනීම සඳහා ලිඛිත තරඟ විභාගයක් පැවැත්වේ. ලිඛිත තරඟ විභාගයෙන් සමත් වූවන් විෂයය පුරප්පාඩු අනුව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයට සහ ප්‍රායෝගික පරීක්ෂණයට යොමු කර කුසලතා අනුපිළිවෙලින් බඳවාගනු ලැබේ.

IV. කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමේ දී රැකියා විරහිත හා ඌණසේවා උපාධිධාරීන්ට ප්‍රමුඛතාවය ලබා දෙන අතර, එම අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය ලබා දීමෙන් පසුව දැනට රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ උපාධිය මූලික සුදුසුකමක් වන තනතුරක සේවයේ නිරත වී සිටින්නන් සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.

6.2 *ලිඛිත තරග විභාගය* - මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| *විෂයය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය (කාලය පැය 01 යි) | 100 | 40 |
| සාමාන්‍ය දැනීම (කාලය පැය 01 යි) | 100 | 40 |

*විභාග පරිපාටිය :*

I මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.

II සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර දෙකටම (02) පෙනී සිටිය යුතු ය.

III සෑම අපේක්ෂකයකුම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. එම භාෂා මාධ්‍යය සිය පත්වීම ලැබීමට අපේක්ෂිත භාෂා මාධ්‍යයම විය යුතු ය.

IV අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතේ දැක්වෙන භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

*විෂය නිර්දේශය :*

විෂය අංක 01 - අභියෝග්‍යතා පරීක්ෂණය

අපේක්ෂකයා සතු කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විතය. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. (එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි).

විෂය අංක 02 - සාමාන්‍ය දැනීම

සමාජ, ආර්ථික, දේශපාලනික ක්ෂේත්‍ර පිළිබඳව වූ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ ප්‍රශ්න 50කින් සමන්විත වේ. (එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 100 කි).

6.3 සම්මුඛ පරීක්ෂණය :-

ගුරු සේවයට බඳවා ගැනීම සඳහා වන මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම, කායික සුදුසුකම් හා මානසික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම, උපාධි පන්ති සාමාර්ථ හා අමතර සුදුසුකම් සඳහා ලකුණු ලබා දීම පිණිස සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(අ) පන්ති සාමාර්ථය සඳහා ලකුණු ලබා දීම (ලකුණු 15)

| *පන්ති සාමාර්ථය* | *ලකුණු* |
|---|---|
| I පන්තිය | 15 |
| II පන්තිය ඉහළ පෙළ | 10 |
| II පන්තිය පහළ පෙළ | 05 |

*(ආ) අමතර සුදුසුකම් සඳහා ලකුණු ලබා දීම. (ලකුණු 15)*

| *අනු. අංකය* | *නිර්ණායකය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01 | දහම් පාසැල් අවසාන විභාග සහතිකය හෝ වෙනත් ආගම් සඳහා ඒ හා සමාන මට්ටමේ විභාගයක් සමත්වී ඇති බවට පිළිගත් සහතිකයක් ලබා තිබීම. | 05 |
| 02 | සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරගාවලියේ හෝ ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලකදී හෝ ක්‍රීඩා සංගම් මඟින් පවත්වනු ලබන ජාතික ශූරතා තරගාවලියකදී හෝ පළාත් මට්ටමේ ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන හෝ දකුණු ආසියාතික තරග, ආසියාතික තරග, පොදු රාජ්‍ය මණ්ඩලීය තරග හෝ ලෝක ශූරතා තරග සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන එකක් හෝ කීපයක් ලබා තිබීම. (සුදුසුකම් සපුරන විට වයස අවුරුදු 15 හෝ ඊට වැඩි විය යුතු යි.) | 05 |
| 03 | සංගීතය / නර්තනය පිළිබඳ ජාතික විභාගය හෝ භාත්ඛණ්ඩේ සංගීත් විභාගයේ හෝ ප්‍රථම මට්ටමේ හෝ එයින් ඉහල මට්ටමේ සහතික එකක් හෝ කීපයක් ලබා තිබීම. (සෞන්දර්ය විෂයයන් සඳහා ඉල්ලුම් කර ඇති අයැදුම්කරුවන්ට මෙම නිර්ණායක සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.) | 05 |
| | මුළු ලකුණු | 15 |

6.4 *ප්‍රායෝගික පරීක්ෂණය* :-

ප්‍රායෝගික පරීක්ෂණයේදී අයැදුම්කරු විසින් හඳුනා ගන්නා ලද මාතෘකාවක් යටතේ විනාඩි 05 කට නොඅඩු ඉදිරිපත් කිරීමක් කල යුතුය. මෙහිදී අයැදුම්කරු සතු අදහස් ප්‍රකාශ කිරීමේ කුසලතාවය හා සන්නිවේදන කුසලතාවය පිළිබඳ විශේෂයෙන් සලකා බලනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 10 ක් ලබා දෙනු ලැබේ.

07. *විභාග මධ්‍යස්ථාන* :-

මෙම තරග විභාගය පහත දැක්වෙන නගරවලදී පවත්වනු ලැබේ. තමන් පදිංචි දිස්ත්‍රික්කය අනුව නගරය තෝරා ගත යුතුයි.

| *දිස්ත්‍රික්කය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| කුරුණෑගල | කුරුණෑගල | 1 |
| පුත්තලම | පුත්තලම | 2 |

08. *තෝරා ගැනීමේ ක්‍රමය* :-

*(අ)* එක් එක් දිස්ත්‍රික්කයේ ඒ ඒ විෂයන් සඳහා ඉල්ලුම් කළ, එම දිස්ත්‍රික්කයේ පදිංචි ඉල්ලුම් කරුවන් , පුරප්පාඩු සංඛ්‍යාවට සම වන්නේනම් හෝ, අඩු සංඛ්‍යාවක් වන්නේනම් එම විෂයයන් සඳහා ලිඛිත විභාගයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් නොපැවැත්වේ. එසේම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් ද සිදු නොකෙරේ. ඒ අනුව ඉල්ලුම් කළ අයගේ මූලික සුදුසුකම් හා අයැදුම්කරු ගුරුවරයෙකු ලෙස රාජකාරි කිරීමට ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වන්නේද යන්න පරීක්ෂා කිරීමක් පමණක් සිදු කර තෝරා ගනු ලැබේ.

*(ආ)* එක් එක් දිස්ත්‍රික්කයේ එක් එක් විෂයය සඳහා ඉල්ලුම් කළ එම දිස්ත්‍රික්කයේ පදිංචි අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි නම් :

i. අදාළ දිස්ත්‍රික්කය සඳහා ඒ ඒ විෂයයන්වලට ඉල්ලුම් කළ, එම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචි ඉල්ලුම්කරුවන් අතුරින් ලිඛිත තරග විභාගයේ විෂයයන් දෙකම සමත් අයගෙන් ඔවුන් විසින් ලබා ගත් කුසලතාවය අනුපිළිවෙලින් එකී දිස්ත්‍රික්කයට

ඒ ඒ විෂයයන් සඳහා බඳවා ගැනීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් (03) සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ii. එම සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ අයැදුම්කරුවන් ලිඛිත විභාගයේ ලකුණු හා සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගත් ලකුණුවල එකතුව මත, කුසලතා අනුපිළිවෙලින් ඒ ඒ විෂයයන් සඳහා බඳවා ගැනීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් (02) ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ.

iii. ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවූ අයැදුම්කරුවන් අතුරින් ලිඛිත විභාගයේ ලකුණු, සම්මුඛ පරීක්ෂණයේ ලකුණු හා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු යන සියළු ලකුණුවල එකතුව අනුව අදාල දිස්ත්‍රික්කය සඳහා ඒ ඒ විෂයය ඉල්ලුම් කළ, එම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් සුදුසුකම් ලැබූවන්ගේ කුසලතා අනුපිළිවෙල තීරණය කරනු ලැබේ.

ඒ අනුව ඉහළම කුසලතාවය ලබාගත් අය පුරප්පාඩු සංඛ්‍යාව අනුව තෝරා ගනු ලැබේ.

*(ඇ)* යම්කිසි විෂයයක් / විෂයයන් සඳහා එක් දිස්ත්‍රික්කයකින් සුදුසුකම් ලැබූ අයැදුම්කරුවන් තෝරාගෙන අවසන් වුව ද, තවදුරටත් පුරප්පාඩු පවතින්නේ නම් ඒ ඒ විෂයයන්ට ඉල්ලුම් කළ අනෙක් දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන්ගේ, ප්‍රමුඛතා ලැයිස්තුවෙන් තෝරාගනු ලැබේ.

*(ඈ)* යම්කිසි අපේක්ෂකයෙකු විෂයයන් දෙකකට (02) හෝ තුනකට (03) තේරී පත් වී ඇති අවස්ථාවක එම අයට පත්වීම් ලබා දෙන විෂයය පිළිබඳව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

09. *විභාග ගාස්තු* :

විභාග ගාස්තු වශයෙන් රුපියල් 500/- ක් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැර වන පරිදි තම ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ව.ප.ස.මු 02 ආකෘතියෙන් ලබා ගත් රිසිට්පත තම අයැදුම්පතෙහි නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතුය. මෙම ලදුපත හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හා මුදල් ඇණවුම් හෝ මුදල් භාර ගනු නොලැබේ. කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බවද සැළකිය යුතු ය.

10. **අයැදුම් කළ යුතු පිළිවෙල :**

10.1. අයැදුම්පත්‍රය - A 4 (සෙ.මී. 21x29) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින්

I. අංක 01 සිට 06 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද,

II. අංක 07 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද , ඇතුළත් වන සේ අයැදුම්පත් පිළියෙල කරගත යුතු ය.

III. ආදර්ශ අයැදුම්පතට අනුකූල නොවන අයැදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයැදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයැදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. තව ද සම්පූර්ණ කරනු ලබන අයැදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයැදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයැදුම්කරුවන් සැළකිලිමත් විය යුතු ය. සම්පූර්ණ කරන ලද අයැදුම්පතේ ඡායා පිටපතක් අයැදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

IV. අයැදුම් කරනු ලබන විෂයය/විෂයයන් කිසිසේත් වෙනස් කරනු නොලබන අතර එක් අයැදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයැදුම්පතක් පමණි.

V. අයැදුම්පත සමග විස්තරාත්මක උපාධි සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතු ය.

VI. අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම :

අයැදුම්පතෙහි අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු /සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු /නීතිඥයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලය ලත් නිලධාරියෙකු / පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 2,40,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන, ස්ථිර තනතුරක් දරන රාජ්‍ය / පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු හෝ විසින් සහතික කර තිබිය යුතු ය.

VII. දැනටමත් රාජ්‍ය හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් තම අයදුම්පත අදාළ ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

10.2. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.06.23 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බී දොරටුව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

අයදුම්පත බහා ඇති කවරයේ වම් පස ඉහළ කෙලවරේ පැහැදිලිව **"වයඹ පළාත් සභා ගුරු සේවයට උපාධිධාරීන් බඳවා ගැනීම - 2017"** සහ පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කළ යුතු ය.

10.3 නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති, 2017.06.23 දිනට හෝ එදිනට පෙර මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් සඳහා තරග විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ලැබේ. එහෙත් මෙම තරග විභාගය සඳහා පෙනී සිටීමට ඉඩදීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවා මෙම නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ බඳවා ගැනීම සඳහා වන අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

11. ***අනන්‍යතාවය :***

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. මේ සඳහා

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පිළිගැනේ.

12. **ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :**

ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගිය හොත් ඔහු / ඇය පළාත් සභා රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පුලුවන. අපේක්ෂකයෙකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු / ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය.

13. මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරා ගැනීම් කිරීම / නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සළසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම / තීරණය කිරීමේ අයිතිය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පද්මිණි කාරියවසම්,
ලේකම් ,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2017 මැයි මස 17 වැනි දින,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා : [ ]

වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීම - 2017

(සිංහල/දෙමළ /ඉංග්‍රීසි මාධ්‍යය)

01. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : [ ] නගර අංකය [ ]

02. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - S දෙමළ - T ඉංග්‍රීසි - E [ ] (පත්වීම් ලැබීමට අපේක්ෂිත භාෂා මාධ්‍යය විය යුතු යි.)
(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

03.

| *ඉල්ලුම් කරන විෂයය/ විෂයයන්* | *විෂය අංකය* |
|---|---|
| | |
| | |
| | |

(ඉල්ලීම් කල හැකි විෂයයන් ගණන උපරිම 03 කි.)

04. 4.1 මුලකුරු සමග නම ( සිංහලෙන් / දෙමළෙන් ) :......................................................................
4.2 මුලකුරු සමග නම ( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :...................................................................
4.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :.........................................................................
4.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..................................................................

05. 5.1 පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :............................. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :................................
5.2 දුරකථන අංකය :.........................................................................................................

වර්තමාන ලිපිනය ( සිංහලෙන් / දෙමළෙන් ) :......................................................................................................
(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

5.3 වර්තමාන ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :...............................................................................................

06. 6.1 ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

6.2 උපන් දිනය :- වර්ෂය : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

6.3 2017.06.23 දිනට වයස : අවුරුදු : [ ][ ] මාස : [ ][ ] දින : [ ][ ]

6.4 ස්ත්‍රී / පුරුෂ භාවය - පුරුෂ - M
ස්ත්‍රී - F [ ]
(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

6.5 විවාහක/අවිවාහක බව :- අවිවාහක - 1
විවාහක - 2 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

07. ලබා ඇති උපාධිය පිළිබඳ විස්තර :

7.1 උපාධිය :................................................................................................................................

7.2 උපාධිය ලබා ගත් විශ්වවිද්‍යාලය :...................................................................................

7.3 උපාධියට හදාරන ලද ප්‍රධාන විෂයය /විෂයයන් :

| |
|---|
| |
| |
| |
| |
| |

7.4 ලබා ඇති පන්ති සාමාර්ථය : ...............................................................................................

7.5 උපාධිය වලංගු වන දිනය : .................................................................................................

7.6 උපාධිය හදාරන ලද මාධ්‍යය : .............................................................................................
(විස්තරාත්මක උපාධි සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුයි.)

7.7 අ.පො.ස. (සා. පෙළ) :

| | *සමත් වූ වර්ෂය* | *විභාග අංකය* |
|---|---|---|
| පළමු වර | | |
| දෙවන වර | | |

| | *විෂයය* | *පළමු වර සාමාර්ථය* | *දෙවැනි වර සාමාර්ථය* |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |
| 06 | | | |
| 07 | | | |
| 08 | | | |
| 09 | | | |
| 10 | | | |

7.8 අ.පො.ස. (උසස් පෙළ) :
සමත් වූ වර්ෂය :...........................
විභාග අංකය :...............................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

8.1 විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :.......................................................................

8.2 ලදුපත් අංකය හා දිනය :.....................................................................................

8.3 ගෙවූ මුදල :.....................................................................................

| ලදුපතේ ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න.<br>ලදුපත නොගැළවෙන සේ මෙහි අලවන්න. |
|---|

09. අයැදුම්කරුගේ සහතිකය :-

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ ම'විසින් සපයා ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවත් ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) ම'විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව ද මම දනිමි. මා මේ තනතුරට තෝරා ගැනීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත්වන බව මම දනිමි.

(ඇ) විභාග ගාස්තු සඳහා වන නියමිත මුදල් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා ලබාගත් කුවිතාන්සිය මෙහි අලවා ඇති බව සහතික කරමි. තව ද විභාගය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් / වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට මම එකඟ වෙමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය :............................

.............................................
අයැදුම්කරුගේ අත්සන.

10. අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයැදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ............................................................... මයා /මිය /මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බව ද, ඔහු /ඇය මා ඉදිරිපිට දී ............................................................... වැනි දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

.................................................................................
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

දිනය :- ...............................................................
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :- ...............................................................
තනතුර :- ...............................................................
ලිපිනය :- ...............................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

11. අයදුම්කරු රාජ්‍ය/ පළාත් සභා රාජ්‍ය සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

............................................................... මයා/ මිය/ මෙනවිය ගේ අයැදුම්පත ඉදිරිපත් කරමි. ඔහු / ඇය මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ස්ථිර / තාවකාලික / අනියම් සේවකයෙකු / සේවිකාවක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය සේවයෙන් නිදහස් කළ හැකි / නොහැකි බවත් දන්වමි.

.............................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ
බලය පවරනු ලැබූ නිලධාරියා.

දිනය :- ...............................................................
තනතුර :- ...............................................................
අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :- ...............................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**උපලේඛන අංක 01**

| විෂය අංකය | විෂයය | සුදුසුකම් | පුරප්පාඩු | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | කුරුණෑගල | | | පුත්තලම | | | |
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | එකතුව |
| | | **ප්‍රාථමික අංශය** | | | | | | | |
| 1 | ප්‍රාථමික | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම සිංහල / දෙමළ විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේ දී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේ දී උපාධිය<br>*හෝ*<br>ජනසන්නිවේදනය / මනෝවිද්‍යාව / සමාජවිද්‍යාව / වාග් විද්‍යාව යන විෂයයක් ඇතුළත්ව ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය සහ අ.පො.ස. (උසස් පෙළ) සිංහල / දෙමළ විෂයය සඳහා සම්මාන සාමාර්ථය හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම | 125 | 32 | - | 175 | 38 | - | 370 |
| | | **අ.පො.ස. (සා.පෙළ) ද්විතීක අංශය (6-11)** | | | | | | | |
| 2 | ගණිතය | ගණිතය විෂයය සහිත විද්‍යාවේ දී / ව්‍යවහාරික විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය සහ උසස් පෙළ සංයුක්ත ගණිතය සමත් වී තිබීම | 54 | 14 | 6 | 55 | 7 | 4 | 140 |
| 3 | විද්‍යාව | ජීව විද්‍යාව / රසායන විද්‍යාව / උද්භිද විද්‍යාව / සත්ව විද්‍යාව / භෞතික විද්‍යාව විෂයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී හෝ ව්‍යවහාරික විද්‍යාවේ දී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 30 | 7 | 3 | 35 | 6 | 2 | 83 |
| 4 | සිංහල/<br>දෙමළ<br>(පළමු බස) | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම සිංහල හෝ සිංහල වාග් විද්‍යාව / දෙමළ හෝ දෙමළ වාග් විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 7 | 3 | - | 20 | 4 | - | 34 |
| 5 | ඉතිහාසය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම ඉතිහාසය / පුරාවිද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 9 | 4 | - | 15 | 6 | - | 34 |
| 6 | භූගෝල විද්‍යාව | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම භූගෝල විද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 10 | 1 | 1 | 7 | 4 | 1 | 24 |
| 7 | ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය | ව්‍යාපාර අධ්‍යයනය / ගිණුම්කරණය / වානිජ්‍ය යන විෂයයන්ගෙන් එක් විෂයක් ඇතුළත් වාණිජවේදී/ ශාස්ත්‍රවේදී / ව්‍යාපාර පරිපාලනවේදී / විද්‍යාවේදී / ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 4 | - | - | 3 | - | - | 7 |
| 8 | චිත්‍ර | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම චිත්‍ර විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 20 | 10 | - | 10 | 7 | - | 47 |

| විෂය අංකය | විෂයය | සුදුසුකම් | පුරප්පාඩු | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | කුරුණෑගල | | | පුත්තලම | | | |
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | එකතුව |
| 9 | නර්තනය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම නර්තනය විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ප්‍රාසාංගික කලාවේදී / ලලිතකලා ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ නර්තනය විෂයය සඳහා විශේෂවේදී උපාධිය | 5 | - | - | 4 | - | - | 9 |
| 10 | පෙරදිග සංගීතය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම පෙරදිග සංගීතය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ප්‍රසාංගික කලාවේදී /ලලිතකලා ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ පෙරදිග සංගීතය විශේෂවේදී උපාධිය | 3 | - | - | 4 | 2 | - | 9 |
| 11 | බටහිර සංගීතය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම බටහිර සංගීතය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ප්‍රසාංගික කලාවේදී /ලලිතකලා ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ බටහිර සංගීතය විශේෂවේදී උපාධිය | 2 | - | - | 3 | - | - | 5 |
| 12 | ජීවන නිපුනතා හා පුරවැසි අධ්‍යාපනය | සමාජ විද්‍යාව / දේශපාලන විද්‍යාව / භූගෝල විද්‍යාව / ජනසන්නිවේදනය / ඉතිහාසය / ආර්ථික විද්‍යාව හෝ එම විෂය සංයෝජන සහිත ඕනෑම ශාස්ත්‍රවේදී උපාධියක් | 5 | 2 | - | 6 | 5 | - | 18 |
| 13 | කෘෂි හා ආහාර තාක්ෂණවේදය | කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය / කෘෂිකර්මය/ ආහාර තාක්ෂණය හා කළමනාකරණය විෂය සහිත විද්‍යාවේ දී සාමාන්‍ය උපාධිය / විශේෂවේදී උපාධිය | 12 | - | - | 8 | - | - | 20 |
| 14 | තොරතුරු තාක්ෂණය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම තොරතුරු තාක්ෂණය / පරිගණක විද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති විද්‍යාවේ දී / තොරතුරු තාක්ෂණවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 12 | 4 | - | 8 | - | - | 24 |
| 15 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | ක්‍රීඩා කළමනාකරණවේදී උපාධිය | 10 | 2 | 1 | 7 | 1 | 2 | 23 |
| 16 | ඉංග්‍රීසි භාෂාව | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම ඉංග්‍රීසි භාෂාව හෝ ඉංග්‍රීසි වාග් විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 10 | 3 | - | 12 | 6 | - | 31 |
| අ.පො.ස.උසස් පෙළ (12-13) | | | | | | | | | |
| 17 | සිංහල /දෙමළ | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම සිංහල හෝ සිංහල වාග් විද්‍යාව / දෙමළ හෝ දෙමළ වාග් විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ ශාස්ත්‍රවේදී විශේෂවේදී උපාධිය | 2 | 4 | - | 3 | - | - | 9 |
| 18 | දේශපාලන විද්‍යාව | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම දේශපාලන විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ දේශපාලන විද්‍යා විශේෂවේදී උපාධිය | 1 | - | - | 2 | - | - | 3 |

| විෂය අංකය | විෂයය | සුදුසුකම් | පුරප්පාඩු | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | කුරුණෑගල | | | පුත්තලම | | | |
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | එකතුව |
| 19 | ඉතිහාසය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම ඉතිහාසය / පුරා විද්‍යාව විෂයය ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ ඉතිහාසය / පුරා විද්‍යාව විශේෂවේදී උපාධිය | 1 | - | - | - | - | - | 1 |
| 20 | නාට්‍ය හා රංග කලාව | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම නාට්‍ය හා රංග කලාව විෂයය ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති ප්‍රසාංගික කලාවේදී /ලලිතකලාවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 1 | - | - | 1 | - | - | 2 |
| 21 | භූගෝල විද්‍යාව | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම භූගෝල විද්‍යාව විෂයය ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 2 | - | - | 3 | - | - | 5 |
| 22 | තර්ක ශාස්ත්‍රය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම තර්ක ශාස්ත්‍රය විෂයය ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 2 | - | - | 2 | - | - | 4 |
| 23 | ජන සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම ජන සන්නිවේදනය / මාධ්‍ය අධ්‍යනය විෂයය ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 1 | - | - | 1 | - | - | 2 |
| 24 | ආර්ථික විද්‍යාව | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම ආර්ථික විද්‍යාව විෂයය ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී / වාණිජවේදී/ ව්‍යාපාර කළමනාකරණවේදී / විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හෝ ආර්ථික විද්‍යාව විශේෂවේදී උපාධිය | 1 | - | - | 2 | - | - | 3 |
| 25 | ව්‍යාපාර අධ්‍යයනය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම ව්‍යාපාර අධ්‍යයනය විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති වාණිජවේදී / ව්‍යාපාර පරිපාලනවේදී / ව්‍යාපාර කළමනාකරණවේදී / විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හෝ ගිණුම්කරණය විශේෂවේදී උපාධිය | 2 | 1 | - | 2 | 1 | 1 | 7 |
| 26 | ගිණුම්කරණය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම ගිණුම්කරණය විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති වාණිජවේදී / ව්‍යාපාර පරිපාලනවේදී / ව්‍යාපාර කළමනාකරණවේදී / විද්‍යාවේදී /ගිණුම්කරණවේදී සාමාන්‍ය උපාධිය හෝ ගිණුම්කරණය විශේෂවේදී උපාධිය | 1 | - | 1 | 1 | - | 1 | 4 |
| 27 | කෘෂි විද්‍යාව | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම කෘෂිකර්මය විෂයය ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය හෝ කෘෂි තාක්ෂණය සහ කළමනාකරණ සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 3 | - | - | 2 | - | - | 5 |
| 28 | සංයුක්ත ගණිතය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම ගණිතය විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය | 3 | - | - | 3 | - | 1 | 7 |

| විෂය අංකය | විෂයය | සුදුසුකම් | පුරප්පාඩු | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | කුරුණෑගල | | | පුත්තලම | | | |
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | එකතුව |
| | | හෝ විශේෂවේදී උපාධිය සමග උසස් පෙළ සංයුක්ත ගණිතය සමත් වී තිබීම. | | | | | | | |
| 29 | භෞතික විද්‍යාව | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම භෞතික විද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී / ව්‍යවහාරිකවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය සමග උසස් පෙළ භෞතික විද්‍යාව සමත් වී තිබීම. | 3 | - | - | 3 | - | 1 | 7 |
| 30 | ජීව විද්‍යාව | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම ජීව විද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී උපාධිය / සත්ව විද්‍යා / උද්භිද විද්‍යාව විෂයය සංයෝජන සහිත විද්‍යාවේදී / ව්‍යවහාරික විද්‍යාවේදී / ජෛවීය විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය සමග උසස් පෙළ ජීව විද්‍යාව සමත් වී තිබීම. | 2 | - | - | 2 | - | 1 | 5 |
| 31 | රසායන විද්‍යාව | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම රසායන විද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය / රසායන විද්‍යාව විෂයය සහිත ව්‍යවහාරික විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 3 | - | - | 2 | - | 1 | 6 |
| 32 | ජෛව පද්ධති තාක්ෂණවේදය | කෘෂිකර්මය / ජීව විද්‍යා විෂයය සහිත විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 4 | - | - | 4 | - | - | 8 |
| 33 | ඉංජිනේරු තාක්ෂණය | ඉංජිනේරු විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය / ඉංජිනේරු තාක්ෂණවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | - | - | - | 4 | - | - | 4 |
| 34 | කොරියන් | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම කොරියන් භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 4 | - | - | 2 | - | - | 6 |
| 35 | ජපන් | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම ජපන් භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 3 | - | - | 1 | - | - | 4 |
| 36 | ප්‍රංශ | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම ප්‍රංශ භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 11 | - | - | 1 | - | - | 12 |
| 37 | ජර්මන් | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම ජර්මන් භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 2 | - | - | 1 | - | - | 3 |
| 38 | චීන | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම චීන භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය | 5 | - | - | 1 | - | - | 6 |

| විෂය අංකය | විෂයය | සුදුසුකම් | පුරප්පාඩු | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | කුරුණෑගල | | | පුත්තලම | | | |
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | එකතුව |
| 39 | ඉංග්‍රීසි භාෂාව | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි වාග් විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය. | 6 | - | - | 2 | - | - | 8 |
| 40 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | තොරතුරු තාක්ෂණවේදී සාමාන්‍ය උපාධිය හෝ විශේෂවේදී උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය). | - | - | - | - | - | 1 | 1 |
| | | **එකතුව** | 381 | 87 | 12 | 417 | 87 | 16 | 1000 |

05/760